සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

නම/විභාග අංකය :- ................................................................................ කාලය : පැය 01 යි.

සැලකිය යුතුයි.

- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
- (ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

01. සිංහල අලුත් අවුරුදු සමයේ දී බොහෝ සිංහලයෝ **ඉස්පාසුවක් නොමැතිව** වැඩ කරති.
    (1) ඉක්මනින් (2) නිහඬව (3) අවිවේකීව (4) සෙමින්

02. වත්පොහොසත්කම් ඉහළ යන විට බොහෝ දෙනෙකුගේ **ඔළුව ඉදිමෙන** බව සමාජයේ පවතින මතයයි.
    (1) හිස අවුල්වීම (2) හිසෙහි රෝගයක් හැදීම
    (3) තනතුරෙන් ඉහළ යාම (4) අහංකාරයට පත්වීම

03. ඇතැම් මොහොතක **කෙන්ද කන්ද කිරීමට** දක්ෂයෝ අප අතර සිටිති.
    (1) අනුන් මුළා කිරීමට (2) කඳු කපා සමතලා කිරීමට
    (3) නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කිරීමට (4) කුඩා දෙයක් විශාල කොට පෙන්වීම

04. උත්සව සමයෙහි දී තමන්ගේ **මඩිය තර කර ගැනීමට** බොහෝ වෙළෙන්දෝ උත්සාහ කරති.
    (1) ව්‍යාපාර සඳහා මුදල් යෙදවීමට (2) නොහික්මුණු ලෙස තම ලාභය වැඩිකර ගැනීමට
    (3) වැඩිපුර භාණ්ඩ විකුණා ගැනීමට (4) තම ගබඩා සම්පූර්ණයෙන් පුරවා ගැනීමට

- අංක 5 සිට 8 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

05. භාෂාවේ විවිධ ස්වරූප .................................................. කරගනිමින් සාහිත්‍යකරුවෝ නිර්මාණය කිරීමට තදින් උත්සාහ දරති.
    (1) සුසංයෝජනය (2) පේමාව (3) සංයෝජනය (4) ප්‍රචිතය

06. බොහෝ සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවලට .................................................. වී ඇත්තේ පන්සිය පනස් ජාතක පොතයි.
    (1) අනුග්‍රහය (2) ආභාසය (3) මූලාශ්‍රය (4) ආධාරක

07. සුන්ත්‍රාගේ නමින් සේනාධීරගේ සිතෙහි ඇතිවන.................................................. අවට පරිසරයේ විචිත්‍රත්වය වර්ණනා කිරීමෙන් තුනී ගන්වයි.
    (1) සන්ත්‍රාසය (2) සම්මෝහය (3) සන්තාපය (4) ප්‍රහර්ෂය

08. පණ්ඩිත් අමරදේව සූරීන් .................................................. සංගීතඥයකු බව විචාරක පිළිගනිති.
    (1) කානගුණ (2) කානනජන (3) කාතවේදී (4) කානනවිකාරී

09. අකාරාදී පිළිවෙළට වචන පෙළී ඇති වරණය තෝරන්න.
    (1) ආගමිකයා, ආරෝපණ, උපේක්ෂා, කප්පර (2) උත්කර්ෂණ, අධ්‍යාපනික, ඇගැයුම, සටහන
    (3) ආන්දෝලන, ඇවිලීම, කම්පනය, ගැළපෙන (4) ඡන්දිය, ආලෝකමන්දා, උතුපුම, ඇල්වා

10. අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
    (1) ආශිර්වාද, ගවේෂණ, ධාර්මිෂ්ඨ, මුහුකුරුනු (2) අභිලාෂ, පිළිගාමී, ගෙවත්ත, විශෝධක
    (3) පෛරාණිකා, විශ්‍රාමාර්ථ, ප්‍රදීපනය, දූර්ලභ (4) සංශෝධන, ළමාගෙය, වාර්තාව, පරීක්ෂණය

11. මිශ්‍රාක්ෂර පමණක් යෙදුණු වරණය තෝරන්න.
(1) ෂ, ඡ, ඪ, ඝ, ෆ (2) ඣ, ඏ, ඨ, ඝ, ඵ (3) ප, ඵ, ඩ, ග, ම (4) ග, ජ, ඩ, ද, ඞ

12. මුලින් දැක්වෙන අක්ෂර වර්ගයට අයත් අකුරක් නොයෙදුණු වචනය සහිත වරණය තෝරන්න.
(1) මූර්ධජ අක්ෂර - ෂෂ්ඨ, ධෛර්යය, ගාථා, කලහණ (2) මහාප්‍රාණ අක්ෂර - ඛනිජ, දන්තධාතු, ප්‍රතිඵල, සාගර
(3) මිශ්‍ර අක්ෂර - මනෂ, පයෝධි, ඖෂධ, භාජනය (4) ඌෂ්මාක්ෂර - ශාලිකය, සංග්‍රහය, ශල්‍යකර්ම, සදාශ

13. පහත දී ඇති පදවල පළමු අක්ෂරයෙහි පිළිවෙළින් පාපිල්ල, කෙටි ඇදපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, රකාරාංශය යෙදී ඇති වරණය තෝරන්න.
(1) පුෂ්පය, ශ්‍රවණ, සිඳුරා, ආදරය (2) රැවති, පැලය, කීර්තිය, ප්‍රශය
(3) ශුද්ධිත, කැලය, රජය, ක්‍රමය (4) බාලිකාව, පෑම්බිල්ල, සීයක්, ශ්‍රමය

14. උක්ත නාමපද දෙකක් හා අනුක්ත නාම පද දෙකක් පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ගායිකාවක, ළමයෙක්, ගිලියන, කුමරෙක් (2) ධීවරයෝ, දරුවනු, මවක්, විදේශිකයෝ
(3) අවි, වැඩිහිටියෙක්, මවුන්, සමණයෙක් (4) කම්කරුවන්, ගිලියන්, වැඩිහිටියෝ, ගුරුවරයන්

15. උපසර්ගයක් නො යෙදී ඇති වචනය සහිත වරණය වන්නේ,
(1) ප්‍රතිඵල, විධිගැනීම, ප්‍රතිපත්ති, සංවිධාන (2) දුම්බිරි, දුශ්චරිත, සුදන, නිර්මල
(3) උපන, සංස්ථාන, අධිකරණ, අප්‍රිත (4) පරිණාමන, ප්‍රසිද්ධ, විපාක, අවතාර

● **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත පදයට ගැළපෙන වරණය තෝරන්න.**

16. **අසනු** මැන දන් ඇදුරු වියැඳුව
(1) පූර්ව ක්‍රියාවකි (2) විධි ක්‍රියාවකි (3) මිශ්‍ර ක්‍රියා පදයකි (4) ආශීර්වාද ක්‍රියාවකි

17. ඇල්වයට ලයාම් ගහනයොට කතුලේ ඉන්න **මැස්සා** අන්ට ඉස්සුවාලු
(1) උත්තම පුරුෂ නාමපදයකි (2) මධ්‍යම පුරුෂ නාමපදයකි
(3) සර්ව නාම පදයකි (4) ප්‍රථම පුරුෂ නාම පදයකි

18. කලා වැවේ **සිල් දියවර අපෙ අම්මා**
(1) උපමාවකි (2) රූපක පදයකි (3) නිපාත පදයකි (4) නාමපදයකි

19. වර්තමාන **ළමා** පරපුර ක්‍රීඩාවෙන් බැහැරවීම නිසා ලෙඩ රෝගවලට ගොදුරුවීමේ ප්‍රවණතාව වැඩි ය.
(1) ක්‍රියා විශේෂණයකි (2) නිපාතයකි (3) නාම විශේෂණයකි (4) කෘදන්තයකි

20. **බලයි** යන ක්‍රියාපදයේ අතීතකාල ඒක වචන මධ්‍යම පුරුෂ ආඛ්‍යාතය වන්නේ,
(1) බලනු (2) බැලීහි (3) බලති (4) බලෙහි

21. දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
(1) උපසර්ග - විශේෂ, ප්‍රබල, දුගත, සුනිල් (2) විධි ක්‍රියා - කරන්න, බල, කියවිය, දියව්
(3) නිපාත - වීදේ, සුරං, ඇසිම්, ල (4) මධ්‍යම පුරුෂ නාම - තෝ, තුඹ, යුෂ්මතිය, මවුන්

22. විරුද්ධාර්ථවත් පද යුගලයක් අඩංගු නොවන වරණය තෝරන්න.
(1) උදක - නිරුදක (2) ආධුනික - ප්‍රවීණයන් (3) ගාඩ - පොහොත (4) උත්තීරණ - අවතීරණ

23. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදැක්වෙන වරණය සහිත පිළිතුර තෝරන්න.
(1) මිතුරු - සඛී, සබඳ, සගයා, මිත් (2) සමුද්‍ර - අර්ණව, සිඳු, ජලනිධි, සාගරය
(3) වනය - අරණ්‍යය, වලාහ, මල්, අඩවි (4) පිළිඹුව - ප්‍රතිරූප, ප්‍රතිබිම්බ, ප්‍රතිමා, පිළිඹිඹු

24. යුගල පදයක් නොවන වරණය සහිත පිළිතුර තෝරන්න.
(1) කඳුකුඩු, යසිනඩ, වාදයන්, ගරුගම්බු (2) ගොඳුවැය, ගුරුගුරුදෑ, තැඟිංබිග, අප්පත්
(3) උදම්පලුව, ගසුලදා, අගනිය, ලෙව්පාලු (4) අච්චාරුව, අරුමපුදුම, අතම්ට, ගොඩින්මඩින්

25. නිවැරදි ලෙස විසන්ධි වී ඇති පද යුගල වන්නේ,
(1) සානු + පමිමින - ඇදරැල + අමා (2) දස් + අත - පුරි + අගත
(3) පවන් + ඉන් - රළ + අවුන් (4) ක්‍රියෝ + ත්සවය - මවුනා + උන්

26. සෑම පදයකම නාම ප්‍රකෘති පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ළමා, බලු, බමර, වැදි　　(2) හැන්දත්, ගිරා, බමුණෙත්, රෙදි

(3) මගුලු, පුටුව, තරුණ, ගව　　(4) තවියා, රිළා, අලි, බිළාල

27. පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් පුවනය වන නිවැරදි ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.

(1) ත් ස බු ර ප ණ　　(2) සි ර ල ය ක ය බ ස් ධි

(3) ෂි ගා පු ත ය　　(4) සි වු කා මි ලො ෂ

● අංක 28, 29 යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස් සහිත වරණය තෝරන්න.

28. ඇතාට අටුකොළ දීම

(1) සුදුසු නොහැකුව යමක් දීම　　(2) තණ්හාවෙන් කරදරයට පත්වීම

(3) ප්‍රයෝජනයට ගත නො හැකි දෙයක් දීම　　(4) අනුන් රවටන්නට යාමෙන් තමන් රැවටීම

29. ගින්නෙන් මිදුණු එකා අළුවේ නැටීම

(1) සිහි ඇතුරතින් නිදහසක් නැති　　(2) එක විපතක් වූවෙතුට තව විපතක් ඒම

(3) සිදු වූ විනාශයක් ගැනිව වැඩ කිරීමයි　　(4) නිෂ්ඵල කාර්යයකි.

30. පහත (අ) කොටසේ දැක්වෙන වචනවල අර්ථය (ආ) කොටස සමග අනුපිළිවෙළින් නිවැරදිව ගැළපෙන වරණය වන්නේ,

| (අ) | | (ආ) | |
|---|---|---|---|
| A | ශෛලිලා | E | හැළුම් |
| B | ඔපලෝකා | F | විසඳුම |
| C | තෝමර | G | රැස්වුන |
| D | සංකාමව | H | කුන්තායුධ |

(1) GEHF　　(2) HFGE　　(3) FEGH　　(4) FGHE

31. පහත සඳහන් කවියේ හිස්තැනට සුදුසු වරණය තෝරන්න.

මඩ වක පිට වක පත්　　වැරටිල්ලා

..............................................　　..................

ඉස ගේ පුපුරවී දත් කඩ　　හොල්ලා

ගිගේ පැම් බමුණා කුණු කෙළ　　හොල්ලා

(1) කදේ කැපින් යසා කැප පව් ඇකලා　　(2) යාගේ උන් බමුණා බම පෙරළා

(3) දෙපටට කුදු ගැසී මකට් කුදුල්ලා　　(4) කොදේ විදින යස විදුමට මකලා

32. ප්‍රාදේශීය ජන ව්‍යවහාරයක් වන ඌව පළාතේ "අම්මණ්ඩි" යනුවෙන් හඳුන්වන්නේ,

(1) මැණිකේ　　(2) අම්මා　　(3) නැන්දා　　(4) මහම්මා

33. A රජය පාසල් දරුවන්ට පෙළ පොත් නිකුත් කරයි. දරුවන් ළඟ පෙළ පොත් නැත.

B පෙළපොත දරුවන්ගේ පරිහරණයටයි. දරුවෝ පොත පත ගෙන කියවති.

C ගුරුවරු පිළු දරුවන්ට මග කියති. ඒමග යන්නන් විරලය.

D සමාජයට ආර්ථිකයට බුද්ධිමතුන් අවශ්‍යයි. රජයේ වියදම් ඵලදායී විය යුතුයි.

ඉහත වාක්‍ය තනි වාක්‍ය වශයෙන් ගැළපීමේ දී නිපාත පද භාවිතයේ වඩාත් යෝග්‍ය අනුපිළිවෙළ වනුයේ,

E - වුවත්　　F - ද　　G - නමුත්　　H - නිසා

(1) F,G,H,E　　(2) F,E,G,H　　(3) H,G,F,E　　(4) G,E,H,F

● පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට ඇතුළු වර වඩාත් නිවැරදි වරණය වන්නේ,

34. මහා විජයබාහු කුමාරයා පාණ්ඩ්‍ය දේශයෙන් කුමාරිකාවක් ගෙනාවා.

(1) මහා විජයබාහු කුමාරයා පාණ්ඩ්‍ය දේශයෙන් කුමාරිකාවක් ගෙනාවේය.

(2) මහා විජයබාහු කුමාරයාණන් පාණ්ඩ්‍ය දේශයෙන් කුමාරිකාවක ගෙනාවේය.

(3) මහා විජයබාහු කුමාරයා පාණ්ඩ්‍ය දේශයෙන් කුමාරිකාවක ගෙනාවේ ය.

(4) මහා විජයබාහු කුමාරයාණෝ පාණ්ඩ්‍ය දේශයෙන් කුමාරිකාවක ගෙනාවේ ය.

35. පහත දැක්වෙන කවියේ තද කළු අකුරින් මුද්‍රිත පද සඳහා යෙදෙන අර්ථ පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

පුසිරිත මිපක **දුසිරිත** කිසි නැගෙන     හැත
**රිසි** වන සියලු **සසිසුරු** රිපි ලෙස ම     ඇත
නිපි කල වැසි ද **සස්** පල නැගි නැගී     ගත
සෙම්පියල් පැසපත් සිරි ලත ලෝ මුදුන්     පත

(1) බෝග අස්වනු, තැමිනි, නරක සිරිත්, යස ඉසුරු
(2) නරක සිරිත්, තැමිනි, යස ඉසුරු, බෝග අස්වනු
(3) බෝග අස්වනු, යසඉසුරු, නරක සිරිත්, තැමිනි
(4) නරක සිරිත්, තැමිනි, බෝග අස්වනු, යස ඉසුරු

- **ප්‍රශ්න අංක 36 සිට 38 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය සහිත වරණය තෝරන්න.**

36. (1) සියලු මිනිස්සු සත්‍ය ගරුක විය යුතුයි. (2) මම මහණදම් පිරිය යුතුයි.
(3) අප ගිලනුන්ට උවටැන් කරනු වේ. (4) පිසුනු පන්තියට පැමිණ නැත.

37. (1) දරුවන් තිසවිංමින් ඇත්වන්නේ ඇයි? (2) දක්ෂ ක්‍රීඩකාවන් වන්නේ කෙසේ ද?
(3) පන්ති කාමරයේ සියලු පිසුන් දක්ෂයෝය. (4) අපි සාමය දැකා තරගන්නේ කවදාද!

38. (1) මට විසින් පුතුන් රකිනු ලබයි. (2) ගුරුවරුන් විසින් පිසුනු යහමග යවනු ලැබූ හ.
(3) ළප විසින් නුඹ දකිනු ලැබුණෙනු (4) වෛද්‍යවරු විසින් රෝගීනු සුවපත් කරනු ලබති.

39. පහත සඳහන් ගීත ඛණ්ඩයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

පටහැණී වෙන්ටා හොව මිනු අණටා
වෙන මග ගැලවෙන්ට
නොපෙනෙන කලටා පැරපෙනු තුමටා
මා දැන් වළකන්ටා

(1) මා වළක්වන්ට පැරපෙන්නේ කුමට? මිනුගේ අණට එකඟ වෙනවා හැර.
(2) මිනුගෙන් ගැළවෙන්ට වෙන මගක් ඇති නිසා මා වළක්වන්නේ ඇයි?
(3) නොපෙනෙන කලට වෙන මගක් නැති නිසා මා වළක්වන්නේ ඇයි?
(4) මිනුගේ අණට පටහැනි වෙන්ට හොව ගැළවෙන්ට වෙන මගක් නොමැති නිසා මා දැන් වළක්වන්ට පැරපෙන්නේ කුමට?

40. දී ඇති ඡේදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

සාර්ථක කෙටි කතාවක් නිර්මාණය කිරීම ආයාසම්භ ව කළ හැකි දෙයක් නොවේ. ඒ සඳහා නිරන්තරයෙන් පුහුණු වීම හෙවත් සතතාභ්‍යාසය අවශ්‍ය ය.

(1) නූතන කෙටිකතාකරුවෝ සතතාභ්‍යාසයේ නිරත විය යුතුය.
(2) සාර්ථක කෙටිකතාවක් ආයාසම්භව කළ හැක්කේ හොව සතතාභ්‍යාසයෙන් කළ යුත්තකි.
(3) සාර්ථක කෙටිකතාවකට ආයාසම්භ හා සතතාභ්‍යාසය අවශ්‍යය.
(4) නිරන්තර පුහුණුවීමෙන් ආයාසම්භ වූ සාර්ථක කෙටිකතා නිර්මාණය කළ හැකිය.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

නම/විභාග අංකය :- ......................................................... කාලය : පැය 02 යි.

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

**අංක (i) සිට (x) තෙක් ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. සිසියම් අනු නොවනසට මිම පිළිතුරු තොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

01. (i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) අගල (ආ) අඟල

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සාවද්‍ය ය. එම වචන දෙක පමණක් නිවැරදි කර ලියන්න.
"කලාවට අධිපති සහ පාර්ශුද්ධභාවයේ සංකේතයක් වන සරස්වතී දේවිය හින්දු සම්ප්‍රදායේ ප්‍රමුඛ දේවතාවියකි.

(iii) පහත සඳහන් වචනවල තද කළු අකුරින් මුද්‍රිත විල්ලම් නම් කරන්න.
(අ) ශීතය (ආ) සර්වමංගලය

(iv) පහත සඳහන් පදවල අනුක්ත පද ලියන්න.
(අ) කුමාරයෝ (ආ) කිලිලක්

(v) තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා ප්‍රභේදය නම් කරන්න.
(අ) ඉදි කළ වැව **බලන්** දුන් (ආ) මැරිගෙනයි අහා යකපෝරුවට නියන්නේ

(vi) පහත සඳහන් පදවල විරුද්ධාර්ථ පද ලියන්න.
(අ) ආයුධ (ආ) ජනාකීර්ණ

(vii) පහත වාක්‍යයේ යෙදී ඇති උපසර්ග දෙකක් උපුටා ලියන්න.
අභිලේඛන ලෙස අභිධර්මය දෙසූ ගාහිමියන්ට දායකයෝ දහම් පඬුරු පූජා කරති.

(viii) පහත දැක්වෙන අදහසට අදාළ ප්‍රස්තාව පිරුළ ලියන්න.
(අ) අය මාර්ග මුළුමනින්ම විනාශකර දැමීම
(ආ) අරමුණින් තොරව වැඩ කිරීම

(ix) ඉරි ඇඳි පද වල අර්ථය ලියන්න.
සාර්ථක කෝර්ටතාවක් නිර්මාණය කිරීම ආයාසමිකව කළ හැක්කක් නොවේ. ඒ සඳහා සහනශීලීත්වය අවශ්‍ය වේ.

(x) පහත ප්‍රාදේශීය ව්‍යවහාරයෙන් ලියා ඇති වාක්‍ය පොදු ව්‍යවහාරයෙන් ලියන්න.
(අ) "ඊයා ගියා පකලයත් අම්බට"
(ආ) "කුඩප්පච්චී පොල් මයනවද?"

(ලකුණු 20)

02. පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අතීත සිංහලයා සිය ජීවිතයේ දුක සැප සමව දරාගත් බව ජනකවිය සාක්ෂි දරයි. ජනකවි කලක් තිස්සේ මුඛ පරම්පරාගතව පැවති නමුදු ක්‍රමයෙන් ව්‍යාප්ත වී අද වන විට එය උසස් සාහිත්‍යාංගයක් බවට පත් වී ඇත. ජීවිතයේ විවිධ ප්‍රශ්න විසඳා ගැනීමට මග පෙන්වීම මෙන්ම ඓතිහාසික සිද්ධීන් ද මුල්කර ගත් ජනකවි අපට සරු උපදෙස් සපයයි. ජනනාට්‍ය කලාව ද අද වන විට බොහෝ ප්‍රචලිත වී ඇත. මේ නිසා සිංහල ජනකවිය වඩාත් අර්ථවත් වී ඇත.

(ආ) අතීතයේ දී අපේ මව්බිම දෙස තොරවුන්ගේ ඇස යොමු වූ තරම් නොතරම් ද යන්න කිවහොත් ඔවුන් විසින් ශ්‍රී ලංකාව හඳුන්වන ලද්දේ "පෙරදිග මුතු ඇටය" යනුවෙනි. ලෝකයේ ඕනෑම රටක පවතින දේශගුණය ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පැවතීම විශේෂත්වයයි. එමෙන්ම ස්වභාව සෞන්දර්යය, ඓතිහාසික උරුමය, ස්වාභාවික සම්පත්, සශ්‍රීකත්වය, ජාතික නිදහස යන ඉසව් ඔස්සේ විමසුම් ඇසින් බැලූ කල ද අපේ මව්බිම පිළිබඳ ඇතිවන්නේ අභිමානවත් හැඟීමකි.

(ඉ) වංචා, දූෂණ, ළමා අපයෝජන අපචාර, වෙඩිතැබීම් ආදී අපරාධ රැසක් පසුගිය කාල වකවානුවේ සිදු වූ බව පෙනේ! ඒය. ඉන් ජනතාවගේ ආකල්පමය පරිහානියක් සිදු වී ඇති බව ධ්වනිත වෙයි. අපරාධ රැල්ල මැඩලීම සඳහා ආකල්ප සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය යන්ත්‍රණය ශක්තිමත් කිරීමට කාලය එළඹ ඇත. මෙහිදී පාසල මගින් නව පරපුරට මෙන් ම පාසැලත් සමාජයට ද ආකල්ප සංවර්ධනය කිරීමේ ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කිරීම කළ හැකිය. මෙයට අමතර ව නීතිමය පියවර ශක්තිමත් කළ යුතුව ඇත.

(ඊ) අද පාසල් සිසුන් අතර සාමාන්‍ය දැනීම ඉතා දුර්වලය. මීට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ පොත්පත් කියවීම ඔවුන්ගෙන් ඈත් වී තිබීමය. පාසල් කාලයෙන් පසු අමතර පන්ති සඳහා සහභාගිවීමත්, රූපවාහිනිය ආදියට ඇබ්බැහිවීමත් ඇතැම් අය මේ සඳහා හේතු ලෙස දක්වති. කියවීම යළිත් පාසල් සිසුන් අතර ජනප්‍රිය කිරීමට පියවර ගත යුතුය. (ලකුණු 25)

03. **පහත සඳහන් ඡේදය වචන 40 - 45 වන සේ සාරාංශ කොට ලියන්න.**

ශ්‍රී ලංකාවේ වාරි හා වාරි තාක්ෂණය පිළිබඳ අවධානය යොමු කරද්දී මතු වී පෙනෙන රාජ්‍ය පාලකයෝ කිහිප දෙනෙක් සිටිති. තම මුළුමහත් ආර්ථික සංවර්ධනයට ඉමහත් සේවයක් කළ මහසෙන් රජතුමාගෙන් රටට වූ සේවය පිළිබඳව ඓතිහාසික මූලාශ්‍රයක් වූ මහාවංශයේ සඳහන් වන්නේ සුළු වශයෙනි. ලංකා ඉතිහාසයේ මහසෙන් රජතුමාට කීර්තිනාම ලබාදීමට උපකාරී වී ඇත්තේ පුරාවිද්‍යා ගවේෂණයන් හා වාරි මාර්ග කටයුතුය. ඇළහැර වැව, මින්නේරි වැව, කවුඩුල්ල වැව මහසෙන් රජුගේ වාරි කර්මාන්ත අතර විශේෂ වේ. සාමාන්‍ය මනුෂ්‍යයන් කෙරෙහි නොපවතින බලයක් රජතුමා කෙරෙහි තිබුණු බව, මහු කළ විස්මය ජනක කර්මාන්ත දුටු ජනතාව විශ්වාස කළහ. එනිසා මහසෙන් රජු දෙවියෙකු සේ සලකා වැඳුම් පිදුම් කළහ. මහසෙන් රජතුමාගෙන් වූ සේවය වාරි මාර්ග අංශයට පමණක් සීමා නොවන අතර මහා විහාරය යළි ගොඩනැගීම හා ජේතවන දාගැබ කරවීම ද, තවත් වෙනත් විහාර කීපයක් කර වීම ගැන ද ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් වේ. (ලකුණු 10)

04. **පහත සඳහන් ඡේදය කියවා අදාළ ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

භාෂාව මානව වර්ගයාට සුවිශේෂී වූ සංසිද්ධියක් වශයෙන් හැඳින්විය හැකිය. එයින් ගම්‍ය වන්නේ වෙනත් සත්ත්ව වර්ගවලට ආවේණික වූ සන්නිවේදන මාර්ග භාෂාවක් ලෙසවත් හැඳින්විය නොහැකි බවයි. මී මැස්සන් වැනි ඇතැම් සත්ත්ව කොට්ඨාසවල සන්නිවේදන ක්‍රම මානව භාෂාවලට යම් යම් සමානතා දක්වතත් මානවයා සතු භාෂාව සත්ත්ව සන්නිවේදනයට වඩා බොහෝවින් ප්‍රබල ද සංකීර්ණ ද වේ. මිනිසා භාෂාව යොදා ගන්නේ තුළදත් තම පැවැත්ම සඳහා පමණක් නොවේ. අනුන් දැනුම්වත් කිරීමට මෙන් ම අනුන්ට තොරතුරු දැනුම්දීමට ද විනෝදාස්වාදය සැපයීමට මෙන්ම සුහදතාව ගොඩ නගා ගැනීමට ද මිනිසා භාෂාව යොදා ගනී. වේදනාවක් ඇති විටක පවා වේදනාවකින් කෑ ගසමින් ගීයක් ගැයීමට නළුවෙකුට හෝ නිළියකට පුළුවන. මිනිසා භාෂාව ලබා ගන්නේ සහජයෙන් ම නොවේ. ඔහු කටහඬත් කථා කිරීමේ ශක්තියත් සහජයෙන්ම ලබයි. එහෙත් ඒ කටහඬත් ශක්තියත් යොදා කථා කරන්නේ කවර භාෂාව ද යන්න තීරණය වන්නේ ඔහු හැදී වැඩෙන සමාජ පරිසරය අනුවයි.

මානව භාෂාව සත්ත්ව සන්නිවේදනයට වඩා ප්‍රබලවීමටත් සංකීර්ණවීමටත් තවත් හේතුවක් වන්නේ එය සංකේතවලින් සැදී තිබීමයි. සත්ත්ව සන්නිවේදනයේ දී සංකේත නො යෙදේ.

(i) මිනිසා කථා කරන්නේ කවර භාෂාවක්ද යන්න තීරණය කරන සාධකය කුමක් ද?

(ii) සතුන්ගේ ශබ්ද භාෂාවක් ලෙස සැලකිය හැකි නොවන්නේ කුමක් නිසාද?

(iii) මිනිසාට සහජයෙන්ම ලැබෙන ශක්තීන් දෙකක් ගැන මේ ඡේදයේ කියැවේ. ඒ මොනවාද?

(iv) භාෂාවෙන් මිනිසාට ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න.

(v) 'උපතින් ම' හා 'හැදෙන්නේ' යන අරුත් දක්වන පද දෙක ඡේදයෙන් උපුටා ලියන්න. (ලකුණු 10යි)

05. අයාලේ යන සුනඛයින් හා වෙනත් සුරතල් සතුන් නිසා ලෝකය පුරා ජලභීතිකා රෝගයට ගොදුරු වන මිනිස් ජීවිත සංඛ්‍යාව ඉහළ යයි. මෙම රෝගයට ප්‍රතිකාර නොමැති වුව ද නිසි කලට එම සතුන්ට එන්නත් ලබාදීමත් අයාලේ යාමට නොදීමත් යන ක්‍රම මඟින් රෝගය මර්දනය කළ හැකිය. මේ තොරතුරු ඇතුළත් කරමින් වසර 2020 වන විට ශ්‍රී ලංකාවෙන් ජලභීතිකා රෝගය තුරන් කිරීමේ අරමුණින් කොළඹ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය මගින් මහජනතාව දැනුම්වත් කිරීම සඳහා සුදුසු අත් පත්‍රිකාවක් සකසන්න. (වචන 100ක් පමණ යොදන්න.)

**නැතහොත්**

ඔබ පදිංචි ප්‍රදේශයෙහි පවතින කුඹුරුයායෙහි දීර්ඝ කාලයක් තිස්සේ ජලය රැඳී තිබෙන නිසා ඒ වගාවෙන් නිසි අස්වැන්නක් ලබා ගැනීමට නොහැකි වී ඇත. ප්‍රදේශයේ ගොවීන් පිරිසක් එකතු වී අලුතෙන් ඇළ මාර්ගයක් කැපීමට අදහස් කර ඇත. ගොවි සංවිධානයේ ලේකම් ඔබ යැයි සිතා ඒ සඳහා අවශ්‍ය අවසර ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ගොවිජන සේවා නිලධාරී වෙත යවන රාජකාරී ලිපිය සකස් කරන්න. (වචන 100ක් පමණ යොදන්න.) (ලකුණු 15යි)

40413

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

කාලය : පැය 02 යි.

නම/විභාග අංකය :- ..............................................................

වැදගත්:- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

01. (i) මම දේවයිනි. සියලු දඹදිව අගනක් රජපුරු කොටකුන් සම්පයේ හිඳි ගයක් නොදිටිමි."

(අ) ඉහත පාඨය ඇතුළත් ග්‍රන්ථයේ නම ලියන්න.

(ආ) එම ග්‍රන්ථය ලියැවුණු සාහිත්‍ය යුගය නම් කරන්න.

(ii) අප බෝසතුන් මෙන
අසාගෙකු ගොම ඇසන ලෙස
සුර රජ සිට ඇසස
..............................................

(අ) මෙම කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.

(ආ) එය උපුටාගත් ග්‍රන්ථයේ නම ලියන්න.

(iii) ඇස ඇති දා යොත ගන්නේ සියන්නවුද
දත ඇති දා උක් අඹු ගිනි ගපින්නවුද
වෙර ඇති දා ගහගන්නේ දිනන්නවුද
යුදු ඇති දා හැති කග තොප් කොටන්නවුද

(අ) මෙම කවියෙන් ලබාදෙන උපදේශය කුමක් ද?

(ආ) සවුව, වීර්යය යන අරුත් දෙන පද දෙක පද්‍යයෙන් උපුටා ලියන්න.

(iv) දේවයන් වහන්ස, කේවට්ටයා මැණිකකින් වැල්වා කරනු කැමැත්තෙමි.

(අ) මෙසේ ප්‍රකාශ කළේ කවු ද?

(ආ) "දේවයන් වහන්ස." යනුවෙන් අමතුවේ කාහට ද?

(v) "මේ ගම් දැන් හොල්මන් අධිකෝඩ පිරුණු යකුන් අරක්ගත් කාලකණ්ණි ගමකි."

(අ) මෙම සිතුවිල්ල කාගේ ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය සිංහලයට අනුවර්තනය කළේ කවරෙක් ද?

(vi) (අ) ගුත්තිල කාව්‍යය රචනා කිරීමේ දී ඇසුරු කරගත් මූලාශ්‍රය නම් කරන්න.

(ආ) ගුත්තිල කාව්‍ය ලිවීමට ආරාධනය කරනු ලැබුවේ කවරකු විසින් ද?

(vii) "නො බව මැනව දේවයන් වහන්ස. රාජ්‍ය සුව අනුභව කළ මැනව"

(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුද?

(ආ) මෙසේ ප්‍රකාශ කළේ කුමන අවස්ථාවේද?

(viii) "ඔව් මං හිතනවා මිනිහා මැරිලා ටි සිපල. නිරගෙදරට යන මිනිස්සු උන් හිටි හැටියෙ මැරෙනවා."

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) 'මිනිහා' යනුවෙන් හඳුන්වා ඇත්තේ කවුරුන් ද?

(ix) (අ) ජනකවියට දිගු ඉතිහාසයක් ඇති බව සඳහන් සංයුක්ත ගීතායවිධ කථාව කුමක් ද?

(ආ) එය රචනා වූ යුගය නම් කරන්න.

(x) (අ) ගුත්තිල කාව්‍යයේ බෝසතුන්ට අභියෝග කළ තරුණ ගාන්ධර්වයා කවු ද?

(ආ) වීණා වාදන තරගයෙන් ජය ලැබීමට බෝසතුන්ට උපකාර වූයේ කවු ද? (ලකුණු 2 × 10 = 20)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "හොඳයි, කරුණාව වේලිච්ච කුඹුරට වැස්සක් වගෙයි කියනවා යන්! ඒත් උඹ ඉල්ලුවන්ගේ වේලිච්ච කුඹුරට තවත් තියන. මං දන්නවා මිනිහා මෙහෙ හිටියා."

(අ) මේ පාඨයෙහි පදනත් උපමාවක් ලියන්න.

(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) අසන රිසින් නයි සැල    මසාළොයා
මවුන් වෙගම සිටිනා    ගුරුළෝයා
වයන ඒ වෙණ නද ගලාබ ම    තාළෝයා
එළිත විපිර පින සිහි නො    තාළෝයා

(අ) ඉහත අවස්ථාවේ වෙර නොකළෝ කවරනු ද?

(ආ) ඉහත පද්‍යයේ අදහස සරල බසින් ලියන්න.

(iii) "මහු පැමිල දණ්ඩ වළල්ලේ ලා 'හොල බුත්මැත්තයන්ගේ පුරුෂයෙකි, සයින් තොම්පැ තෙල මල තබා හිස පැළඳ ගගන ඇඹිල දඩු හුපාගෙන බඩ පුරා කා විසව'"

(අ) ඇඳින පදවලට අර්ථය සපයන්න.

(ආ) ඉහත අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.

(iv) වරද පොගන තරමට වැරදුණා    ගොඩේ
වරද ඇතත් හිකරුණෙ වැඩ කළා    ගොඩේ
වරද පෙනෙති වැඩ නුගත් අයට    ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ

(අ) ඉහත කවියෙන් දැක්වෙන පරිදි වරද පෙනෙන්නේ කවුරුන් හටද?

(ආ) කවියෙන් දෙන උපදේශය කුමක්ද?

(v) පටන් පුරිදු පුන් උපදෙස්    සිහිකොට
ඉටන් බෙහෙත් දැමුවෙන් ගුළි    අහසට
ඉටන් වච්න පුර අඟගෝ බැස    සිට
පටන් ගත්තු නව සිපයත්    හැටුමට

(අ) ඉරි ඇඳි පදවල අර්ථ සපයන්න.

(ආ) අදාළ අවස්ථාව කෙටියෙන් ලියන්න. (ලකුණු 4 × 5 = 20)

03. උම්මග්ග ජාතකයේ,

(අ) මහෞෂධයන්ගේ චරිතයෙන්

(ආ) සේවට්ටයන්ගේ චරිතයෙන්

ඔවුන් තුළ තිබූ ප්‍රඥා උපක්‍රමශීලිත්වය ප්‍රකට වේ. සුදුසු උදාහරණ දෙක බැගින් දෙමින් ඉහත ප්‍රකාශය විමසන්න.

නැතහොත්

(අ) සරල බස්වහරක් යොදා ගැනීම

(ආ) සරල උපමා රූපක භාවිතය

ජාතක සාහිත්‍යය තුළ දැකිය හැකිය. 'තානා ගීය පාගා ඇඩහැරෙන් ඇගේ. කව් පන්තියෙන් නිදසුන් දෙක බැගින් දක්වමින් විග්‍රහ කරන්න. (ලකුණු 15)

04. බද්දේගම නවකතාවේ

(අ) ගැමියන්ගේ ක්‍රියාකලාපය

(ආ) ස්වාභාවික පරිසරය

ගමේ පරිහානිය ළඟා කරදීමට ඉවහල් වී ඇත. නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත්

ගුත්තිල කාව්‍ය කතුවරයා

(අ) සරල බස්වහරක් ද

(ආ) විසත් බස්වහරක් ද

ස්වකීය නිර්මාණයේ දී භාවිත කර ඇත. සුදුසු උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

● **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

05. බද්දේගම සුන්දරත්වයෙන් පිරුණු වගගත ගමක් නොව කටුක බවින් හා දරිද්‍රතාවයෙන් පිරුණු ගමකි. සුදුසු උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. ගුත්තිල කතුවරයා වීණා වාදනයේ මිහිරියාව ඉස්මතු කරන්නේ අවට පරිසරයේ පිළිබිඹු සමඟ ගළපමිනි. සුදුසු උදාහරණ තුනක්වත් දෙමින් ඉහත කියමන පහදන්න. (ලකුණු 10)

07. උම්මග්ග ජාතකයේ මහෞෂධයන්ගේ චරිතය තුළින් ප්‍රඥාවෙන් අභියෝගයන් ජයගත හැකි බව පෙන්වා දෙයි. සුදුසු උදාහරණ තුනක්වත් දෙමින් විමසන්න. (ලකුණු 10)